# විශේෂ නිවේදනයයි !

ඊශ්‍රායලයේ වෙසෙන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

## කොන්සියුලර් සේවා සීමා කිරීම

**ඊශ්‍රායලයේ** කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදන වලට වැඩිමනත් වශයෙනි.

COVID - 19 පැතිරීම හා සම්බන්ධ අවදානම්කාරී තත්වය සැලකිල්ලට ගනිමින්, කොන්සියුලර් සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන ශ්‍රී ලාංකිකයන් හට කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම/අවම කිරීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නැවත දැනුම් දෙන තුරු සියලුම කොන්සියුලර් සේවාවන් සීමා කිරීමට තීරණය කර ඇත.

කෙසේ වෙතත්, තානාපති කාර්යාලය විසින් පහත සඳහන් හදිසි කොන්සියුලර් සේවාවන් සපයනු ලබන අතර එම සේවාවන් ලබා ගැනීම සඳහා තානාපති කාර්යාලයට පැමිණීමට පෙර ඒ සඳහා වේලාවක් වෙන්කර ගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලාංකික ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු.

1). ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ශ්‍රී ලංකාවට යෑමට හදිසි ගමන් බලපත්‍ර නිකුත් කිරීම (NMRP)
2). ඊශ්‍රායලයේදී සිදුවන ශ්‍රී ලාංකිකයින්ගේ මරණ සම්බන්ධයෙන් අවශ්‍ය ලිපි ලේඛන නිකුත් කිරීම
3). COVID - 19 වසංගතය පිළිබඳ හදිසි විමසීම්
4). වෙනත් හදිසි සේවාවන්

පැමිනීමට පෙර වේලාවක් වෙන් කර ගැනීම සඳහා කරුණාකර පහත අංක අමතන්න;

කොන්සියුලර් සේවා - 058 6875764 (කේ. පී. චන්ද්‍රතිලක මහතා, පරිවාර නිළධාරි)
කම්කරු සේවා - 058 5873338 (ඉන්දිකා සේනරත්න මිය, කම්කරු නිළධාරි)

කලින් දැනුම් දුන් පරිදි, ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා ප්‍රජාවේ අතිශය හදිසි අවශ්‍යතාවයන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පහත සඳහන් ජංගම දුරකථන අංකය 2020 මාර්තු 09 වන දින සිට පැය 24 පුරා ක්‍රියාත්මක වේ.

රුවන් වික්‍රමසිංහ මහතා - 054 7215815
දෙවන ලේකම් (රැකියා හා සුභසාධන)

ඊශ්‍රායල් රාජ්‍ය තුළ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සහ එය මර්ධනය කිරීම සඳහා දැනට බලපත්වන උපදෙස් සම්බන්ධයෙන් වැඩිදුරටත් දැන ගැනීම සඳහා පහත දැක්වෙන ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියට පිවිසෙන මෙන් කාරුණිකව දන්වනු ලැබේ.

https://govextra.gov.il/ministry-of-health/corona/corona-virus-en/

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවීව්, ඊශ්‍රායලය**

23.03.2020